සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

22 | S | 1

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019

**Second Term Test - Grade 13 - 2019**

විභාග අංකය ........................

භූගෝල විද්‍යාව I

## <u>II කොටස</u>

01). i. සිතියම් ගත ප්‍රදේශයේ අංක 1න් දැක්වෙන AB රේඛාවෙන් නිරූපණය කර ඇති භෞතික ලක්ෂණය නම් කරන්න. (ල. 1)

ii. සිතියමේ අංක 3, 4, 5, 6 ස්ථානවල දක්වා ඇති ලක්ෂණ නම් කරන්න. (ල. 2)

iii. සිතියම් ප්‍රදේශයේ F හා G චතුරස්‍රවල හඳුනාගත හැකි ස්වභාවික වෘක්ෂලතා වර්ග නම් කරන්න. (ල. 2)

iv. E චතුරස්‍රය දෙගුණයකින් විශාලනය කර, විශාලනය කළ සිතියම් කොටසේ අප්‍රධාන මාර්ගය ඇඳ දක්වන්න. එම සිතියම් කොටසට අදාළ නියෝජ්‍ය පරිමාණය ලියන්න. (ල. 4)

v. සිතියම් ප්‍රදේශයේ පහත සඳහන් භූමි පරිභෝග රටාවන් ව්‍යාප්ත වීමට බලපා ඇති සාධක පැහැදිලි කරන්න.

A. වගාවන් B . ජනාවාස C . මාර්ග (ල. 6)

vi. සිතියම් ප්‍රදේශයේ බටහිර අර්ධය හා නැගෙනහිර අර්ධය තුළ හඳුනාගත හැකි භෞතික ලක්ෂණ විස්තර කරන්න. (ල. 5)

02). සපයා ඇති ලෝක සිතියමෙහි පහත සඳහන් දෑ ලකුණු කරන්න.

- ඇට්ලස් කඳුවැටිය
- තායිවානය
- ඇලස්කාව
- කොංගෝ ගංගාව
- සිංගප්පූරුව
- කට්මායි ගිනිකන්ද
- අගුල්හාස් ප්‍රවාහය
- අප්‍රිකානු මහද්වීපයට අයත් වන සුවිභේද නිම්න කලාපය
- ලෝකයේ පියස්ස ලෙසින් හැඳින්වෙන සානුව
- පෙට්‍රෝලියම් අපනයනය කරන ප්‍රධාන රටක් වන ඕමානය (ල. 10)

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

22 S II

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019

0507

**Second Term Test - Grade 13 - 2019**

විභාග අංකය ............................ භූගෝල විද්‍යාව II කාලය පැය තුනයි

- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විතය.
- එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් වත් තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

Sanduni Ranasinghe

## I කොටස

## භෞතික භූගෝල විද්‍යාව

01). තැටි භූ තාරකා කල්පිතයට අනුව ලෝකයේ තැටි මායිම් පහත සිතියමේ දැක්වේ.




i. සිතියමේ A, B, C අක්ෂර වලින් පෙන්වා දී තැටි මායිම් වර්ග තුන නම් කරන්න. (ල. 3)

ii. B හා C තැටි මායිම් ආශ්‍රිත ක්‍රියාවලිය පැහැදිලි කරන්න. (ල. 6)

iii. පෘථිවි අභ්‍යන්තරයේ හට ගන්නා භූ චලන නිර්මාණය වීමට බලපාන හේතු කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 5)

iv. සිරස් භූ චලන ක්‍රියාකාරීත්වය මත ඇති වන ආතතීය චලන මගින් නිර්මාණය වන භූ රූප තුනක් රූප සටහන් සමඟින් විස්තර කරන්න. (ල. 6)

02). i. ඛනිජ යන්න නිර්වචනය කරන්න. (ල. 2)

ii. ශ්‍රී ලංකාවේ හමුවන පහත සඳහන් ඛනිජ වර්ග වලට නිදසුන් දෙක බැගින් නම් කරන්න.

1. බලශක්තිමය ඛනිජ
2. ලෝහමය ඛනිජ
3. ලෝහමය නොවන ඛනිජ

(ල. 6)

iii. ශ්‍රී ලංකාවේ හමුවන ඛනිජ අතරින් රට තුළ නිෂ්පාදන කර්මාන්ත සඳහා අමුද්‍රව්‍ය ලෙස භාවිතා කරන ඛනිජ වර්ග තුනක ව්‍යාප්තිය, නිෂ්පාදන පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 6)

iv. "ලෝකයේ ඉතාම වටිනා ඛනිජ ශ්‍රී ලංකාවෙන් හමුවේ." නමුත් බොහෝමයක් ඛනිජ අපනයනය කරයි. ඒ සඳහා බලපාන සාධක තුනක් පැහැදිලි කරන්න. (ල. 6)

03). i. ගංගාවක වෘද්ධ අවධියේ නිර්මාණය වන භූ රූප රූප සටහනේ දැක්වේ. එම භූ රූප අංක සහිතව නම් කරන්න. (ල. 4)

ii. ගංගා ඛාදන චක්‍රයට අනුව ගංගාවක ඛාදන ක්‍රියාවලිය කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 6)

iii. ලෝකයේ බොහෝ කාන්තාර වලට ලැබෙන කෙටි වර්ෂාපතනය මගින් කාන්තාර ප්‍රදේශවල භූ රූප නිර්මාණය කරයි. කාන්තාර ප්‍රදේශවල ජලයෙන් නිර්මාණය කරන භූ රූප තුනක නිර්මාණ ක්‍රියාවලිය පැහැදිලි කරන්න. (ල. 6)

iv. ගංගා භූ රූප ආශ්‍රිතව සිදුකරන මානුෂ ක්‍රියාකාරකම් තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 4)




04). i. පහත සටහනට අනුව අංක 1, 2, 3 ට අදාළ වන දේශගුණික සාධකය බැගින් නම් කරන්න. (ල. 3)

ශ්‍රී ලංකාවේ දේශගුණය කෙරෙහි බලපාන සාධක

| ගෝලීය සාධක | කලාපීය සාධක | ස්ථානීය සාධක |
|---|---|---|
| 1.______________ | 2.______________ | 3.______________ |

ii. ශ්‍රී ලංකාවට බලපාන සංවහන වර්ෂාපතන ක්‍රියාකාරීත්වය කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 5)

iii. ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප අතරින් කඳුකර තෙත් කලාපය තුළ හඳුනාගත හැකි සුවිශේෂී ලක්ෂණ තුනක් පැහැදිලි කරන්න. (ල. 6)

iv. ශ්‍රී ලංකාවේ දේශගුණයේ සුවිශේෂී ලක්ෂණ ජීවීන්ට හිතකර ලෙස බලපාන ආකාරය කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 6)

## II කොටස

## මානුෂ භූගෝල විද්‍යාව

05. i. ජන සංඛ්‍යාවේ ස්වාභාවික වර්ධනය යන්න පැහැදිලි කරන්න. (ල.3)

1977 – 2015 දක්වා ශ්‍රී ලංකා ජන සංඛ්‍යාවේ ස්වාභාවික වර්ධන ශීඝ්‍රතාවය පහත වගුවේ දැක්වේ.

| වර්ෂය | ජන සංඛ්‍යාව මිලියන | ස්වාභාවික වර්ධන අනුපාතිකය (%) |
|---|---|---|
| 1997 | 17.7 | 1.3 |
| 1998 | 17.0 | 1.2 |
| 1999 | 18 | 1.2 |
| 2000 | 18 | 1.2 |
| 2001 | 18 | 1.3 |
| 2002 | 19 | 1.3 |
| 2003 | 19 | 1.3 |
| 2004 | 19.4 | 1.3 |
| 2005 | 19.6 | 1.1 |
| 2006 | 19.8 | 1.3 |
| 2007 | 20 | 1.3 |
| 2008 | 20.2 | 1.3 |
| 2009 | 20.4 | 1.2 |
| 2010 | 20.6 | 1.1 |
| 2011 | 20.8 | 1.2 |
| 2012 | 20.3 | 1.1 |
| 2013 | 20.4 | 1.2 |
| 2014 | 20.7 | 1.1 |
| 2015 | 20.9 | 0.8 |

මූලාශ්‍ර - ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

ii. ඉහත වගුවට අනුව ශ්‍රී ලංකා ජන සංඛ්‍යා වර්ධනයේ හඳුනාගත හැකි ලක්ෂණ තුනක් ලියා දක්වන්න. (ල. 3)

iii. රට තුළ ජන සංඛ්‍යා වර්ධනය අඩු වීම නිසා ඇතිවන හිතකර බලපෑම් දෙකක් හා අහිතකර බලපෑම් දෙකක් පැහැදිලි කරන්න. (ල. 8)

iv. ජන සංඛ්‍යා වර්ධනය ඉහළ යාම නිසා යම් රටවල් මුහුණ පාන ගැටළු නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ල. 6)

05). පහත දැක්වෙන්නේ 2000 වර්ෂයේ සිට 2015 දක්වා වසර 16 ක වර්ෂාපතන දත්තයන් ය. මෙම දත්ත ලබාගෙන ඇත්තේ රුහුණු විශ්වවිද්‍යාල මාපලාන කෘෂිකර්ම පීඨයේ පිහිටි කාලගුණ දත්ත මධ්‍යස්ථානයෙනි. (වර්ෂාපතනය මිලි මීටර් )

| වර්ෂය | වර්ෂාපතනය (මි.මී.) |
|---|---|
| 2000 | 632.1 |
| 2001 | 1335.9 |
| 2002 | 1207.2 |
| 2003 | 1040.4 |
| 2004 | 785.3 |
| 2005 | 1453.2 |
| 2006 | 1103.9 |
| 2007 | 953.8 |
| 2008 | 990.2 |

| වර්ෂය | වර්ෂාපතනය (මි.මී.) |
|---|---|
| 2009 | 576.6 |
| 2010 | 568.36 |
| 2011 | 783.2 |
| 2012 | 926.7 |
| 2013 | 638.5 |
| 2014 | 589.2 |
| 2015 | 662.3 |
| 2016 | 566.1 |

මූලාශ්‍රය - කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

i. ඉහත දත්ත භාවිතා කරමින් සමූහිත සංඛ්‍යාත ව්‍යාප්ති වගුවක් සකස් කරන්න. (පන්ති ප්‍රාන්තර 05කට සීමා කරන්න. ) (ල.4)

ii. මාතර දිස්ත්‍රික්කයේ වර්ෂාපතන දත්ත භාවිතා කරමින් ප්‍රතිශත සමුච්චිත සංඛ්‍යාත වක්‍රය නිර්මාණය කරන්න. (ල. 8)

iii. ඔබ නිර්මාණය කළ සමුච්චිත සංඛ්‍යාත වක්‍රයට අනුව වර්ෂාපතනය පිළිබඳව හඳුනාගත හැකි ලක්ෂණ පැහැදිලි කරන්න. (ල. 3)

06). i. ප්‍රස්තාරික ක්‍රම මගින් දත්ත ඉදිරිපත් කිරීමේ දී ඇති වාසි 2ක් ලියන්න. (ල. 2)

ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන බෝග 2 ක් වන පොල් හා තේ නිෂ්පාදනවල අපනයන ඉපයුම් ප්‍රමාණය (2010 - 2015) පහත දැක්වේ.

| වර්ෂය | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 |
|---|---|---|---|---|---|---|
| පොල් (රු. දසලක්ෂ) | 2561 | 2631 | 2552 | 2828 | 3055 | 3925 |
| පොල් තේ (රු. දසලක්ෂ) | 6091 | 6939 | 3110 | 9119 | 9174 | 9080 |

මූලාශ්‍ර: ශ්‍රී ලංකා ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

ii. ශ්‍රී ලංකාවේ 2010 - 2015 පොල් හා තේ අපනයන ඉපයුම් දත්ත භාවිතා කරමින් ද්විත්ව තීරු ප්‍රස්තාරය නිර්මාණය කරන්න. (ල. 8)

iii. 2010 - 2015 දක්වා කාලයේ දී ශ්‍රී ලංකාවේ පොල් හා තේ අපනයනයේ වෙනස්කම් සංසන්දනාත්මකව සාකච්ඡා කරන්න. (ල. 5)

06). i. නාගරීකරණ ක්‍රියාවලිය කෙරෙහි බලපාන ප්‍රධාන සාධක තුනක් නම් කරන්න. (ල.3)

2014 වර්ෂයේ දී ලෝකයේ අධික සහ අවම නාගරීකරණ මට්ටම සහිත රටවල් පහත වගුවේ දැක්වේ.

| තරාව | රට | නාගරීකරණ ප්‍රතිශතය | රට | නාගරීකරණ ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 1 | චීනය, හොංකොං | 100 | ට්‍රිනිඩෑඩ් සහ ටොබැගෝ | 8.6 |
| 2 | චීනය, මැකාවෝ | 100 | බුරුන්ඩි | 11.8 |
| 3 | සිංගප්පූරුව | 100 | පැපුවා නිව්ගිනියා | 13.0 |
| 4 | කටාර් | 99.2 | උගන්ඩා | 15.8 |
| 5 | ග්වාඩලූප් | 98.4 | මලාවි | 16.1 |
| 6 | කුවේට් | 98.3 | නේපාලය | 18.2 |
| 7 | බෙල්ජියම | 97.8 | ශ්‍රී ලංකාව | 18.3 |
| 8 | මෝල්ටා | 95.3 | නයිජර් | 18.5 |
| 9 | ඇ.එ.ජ. වර්ජින් දූපත් | 95.2 | සාන්ත ලුසියා | 18.5 |
| 10 | උරුගුවේ | 95.2 | දකුණු සුඩානය | 18.6 |

මූලාශ්‍ර - ජන හා සංඛ්‍යා දෙපාර්තමේන්තුව

ii. ඉහත වගුවට අනුව ලෝකයේ නාගරීකරණ මට්ටම්වල කලාපීය වශයෙන් හඳුනා ගත හැකි ලක්ෂණ පහක් ලියා දක්වන්න. (ල. 5)

iii. ලෝකයේ විවිධ රටවල නාගරීකරණය නිසා මුහුණ දෙන ගැටලු තුනක් පැහැදිලි කරන්න. (ල. 6)

iv. ලෝක නාගරීකරණයෙහි වර්තමානයේ හඳුනාගත හැකි ප්‍රවණතතා පැහැදිලි කරන්න. (ල. 6)

07). i. හරිත විප්ලවය යන්න නිර්වචනය කරන්න. (ල. 3)

ii. කෘෂිකාර්මික තාක්ෂණය ඇසුරින් හරිත විප්ලවය යටතේ ක්‍රියාත්මක වන ප්‍රධාන අංග දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 6)

iii. නව කෘෂි තාක්ෂණික ක්‍රමවේදවල වාසිදායක අවස්ථා තුනක් පැහැදිලි කරන්න. (ල. 6)

iv. කෘෂිකර්මාන්තය සඳහා නවීන යන්ත්‍ර සූත්‍ර භාවිතයෙන් ඇති අවාසි දෙකක් පැහැදිලි කරන්න. (ල. 5)

08). i. නිෂ්කර්ශක කර්මාන්ත හා නිෂ්පාදන කර්මාන්ත අතර වෙනස පැහැදිලි කරන්න. (ල. 3)

ii. නිෂ්පාදන කර්මාන්ත ස්ථානගත වීමට බලපාන පහත දැක්වෙන සුවිශේෂී සාධක නිදසුන් සහිතව විස්තර කරන්න.

A. අමුද්‍රව්‍යය B . ශ්‍රමය C . ප්‍රාග්ධනය (ල. 6)

iii. ඕනෑම කර්මාන්තයක් සඳහා "රාජ්‍ය ප්‍රතිපත්තිවල බලපෑම වැදගත් වේ." පැහැදිලි කරන්න. (ල. 5)

iv. කර්මාන්ත ස්ථාන ගතවීමේ මෑත කාලීන ප්‍රවණතා තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 6)

## III කොටස

03).



A



B

i. ඉහත අංක A හා B පින්තූරවලින් දැක්වෙන උපකරණ දෙක නම් කර එම උපකරණ භාවිතා කරන නව සිතියම් විද්‍යාත්මක ක්‍රමවේදය නම් කරන්න. (ල. 3)

ii. එම නම්කළ සිතියම් විද්‍යාත්මක ක්‍රමවේදය කෙටියෙන් හඳුන්වන්න. (ල. 2)

iii. ඉහතින් ඔබ දැක්වූ නව සිතියම් විද්‍යාත්මක ක්‍රමවේදයේ භාවිතා කරන ආදාන උපාංග තුනක් පහතින් දැක්වේ. ඒ පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න.

A . පරිගණකය B . මුද්‍රණ යන්ත්‍රය C . චුම්බක තැටි (ල. 6)

iv. එම නම්කළ සිතියම් විද්‍යාත්මක ක්‍රමවේදය ව්‍යාපාරික ක්ෂේත්‍රයේ භාවිතා කරන අවස්ථා දෙකක් පැහැදිලි කරන්න. (ල. 4)

04). i. දුරස්ථ සංවේදනය (RS) යනු කුමක්දැයි හඳුන්වන්න. (ල. 2)

ii. දුරස්ථ සංවේද ක්‍රියාවලිය දැක්වෙන රූපසටහනෙහි A,B, C නිවැරදිව නම් කරන්න. (ල. 3)




iii. ශක්ති මූලාශ්‍රය අනුව සිදු කරනු ලබන දුරස්ථ සංවේද වර්ග දෙක (A,B) හා කක්ෂීය ගමන් රටාව අනුව (C,D) වර්ග කළ හැකි චන්ද්‍රිකා වර්ගදෙක නම් කරන්න. (ල. 2)




iv. (a) ලබා ගන්නා කෝණය අනුව ගුවන් ඡායාරූප වර්ග දෙක නම් කරන්න. (ල. 1)

(b) ඉන් එක් වර්ගයක් විස්තර කරන්න. (ල. 3)

v. භූමි පාදක වේදිකා මගින් හා චන්ද්‍රිකා සංවේදක මගින් ලබා ගන්නා තොරතුරුවල වෙනස්කම් දක්වන්න. (ල. 4)